# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2470/04 - 2026 ජනවාරි මස 05 වැනි සඳුදා - 2026.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී.-බී 3/2022

**2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත**

2 වන වගන්තිය යටතේ වූ නියමය

2002 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනතේ 2 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය, හර්ෂණ නානායක්කාර වන මා විසින්, මේ නියමය මගින්, ඉහත කී පනතේ විධිවිධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව සහ මාලදිවයින් ජනරජයේ ආණ්ඩුව අතර 2025 ජූලි මස දී අත්සන් කරන ලද ගිවිසුම සම්බන්ධයෙන් අදාළ විය යුතු බවට ප්‍රකාශයට පත් කරමි. ශ්‍රී ලංකාවේ ආණ්ඩුව සහ මාලදිවයින් ජනරජයේ ආණ්ඩුව අතර ඇති කරගත් මෙම ගිවිසුම මගින් සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව දැක්වීම සම්බන්ධයෙන් කටයුතු කරන අතර, වෙනත් කරුණු අතර, ත්‍රස්තවාදයට සම්බන්ධ අපරාධ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම සඳහා භාවිත කිරීමට අදහස් කරන ලද අරමුදල් සහ අපරාධයකින් උත්පාදිත දේ සහ අපරාධ මෙවලම් සොයාගැනීම, තහනම් කිරීම, අභිමි කිරීම හෝ රජසන්තක කිරීම ඇතුළු අපරාධ වැළැක්වීම, විමර්ශනය කිරීම, නඩු පැවරීම සහ මැඩ පැවැත්වීම සම්බන්ධ සාපරාධී කාරණාවල දී සහය සහ අන්‍යෝන්‍ය නෛතික සහයෝගීතාව දැක්වීම මගින් ගිවිසුමේ දෙපාර්ශවයේම භූමිකාව වඩාත් ඵලදායී ලෙස ඉටු කිරීම පිළිබඳව සලකා බලනු ලැබේ.

**හර්ෂණ නානායක්කාර,**
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍ය.

2025 දෙසැම්බර් මස 24 වැනි දින,
කොළඹ දී ය.

EOG 01 - 0033


1A - PG 7449 — 353 (2026/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*